ඉතාලිය

EUROPEAN UNION AGENCY FOR ASYLUM

# මගේ පුද්ගලික දත්ත යුරෝඩැක් වෙත සම්ප්‍රේෂණය කරන්නේ ඇයි?

D ප්‍රකාරය

**සාමාජික රටක නීති විරෝධී ව රැඳී සිටින තුන්වන ලෝකයේ රටවල ජාතිකයන් හෝ රටක පුරවැසිභාවයක් නොමැති පුද්ගලයින්**



SINHALESE

## මට මෙම විස්තර පත්‍රිකාව ලැබෙන්නේ ඇයි?

ඔබ අවසරයකින් තොරව මෙම රටේ රැඳී සිටින බව සොයාගෙන ඇත.

මෙම විස්තර පත්‍රිකාව බලධාරීන් විසින් ගබඩා කරගනු ලබන දත්ත පිළිබඳ ව සහ ඒ කොපමණ කාලයක් සඳහා ද යන්න පිළිබඳ ව වැඩිදුර තොරතුරු ලබා දෙයි.

## මට මගේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබා දීමට සිදුවන්නේ ඇයි?

මේ රටේ බලධාරීන් ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූප ලබා ගනු ඇත. මෙම දත්ත, ඔබේ අනන්‍යතාවය පිළිබඳ ව තොරතුරු සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ යුරෝඩැක් දත්ත සමුදාය වෙත සම්ප්‍රේෂණය කෙරෙනු ඇත.

යුරෝඩැක් EU+ රටක ජාතිකයන් නොවන ඇතැම් කාණ්ඩවල පුද්ගලයින්ව ඔවුන්ගේ අනන්‍ය ඇඟිලි සලකුණු සහ ඡායාරූප කට්ටලය හා සම්බන්ධ කරයි.

මෙම දත්ත සමුදාය EU+ රටවල් 31ක් විසින් භාවිත කරනු ලබන අතර ඔවුන්ට ඔබේ තොරතුරු ලබාගැනීමට ඔබේ දත්ත සැකසීමේ හැකියාව ඇත. EU+ රටවල් මෙම විස්තර පත්‍රිකාව අවසානයේ ලැයිස්තුගත කර ඇත.

**ඔබ දැන් ඉතාලිය හි සිටින අතර, එය EU+ රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

## යුරෝඩැක්හි ගබඩා කර ඇති තොරතුරු මොනවාද?



පහත සඳහන් තොරතුරු සැමවිටම ගබඩා කෙරේ:

- ඔබේ ඇඟිලි සලකුණු
- ඔබේ මුහුණේ ඡායාරූපයක්
- ඔබ දැන් භාවිත කරන හෝ අතීතයේ භාවිත කර ඇති සියලුම නම්
- ඔබ දැන් භාවිත කරන හෝ අතීතයේ භාවිත කර ඇති සියලුම උපන් දින
- ඔබේ උපන් ස්ථානය
- ඔබේ ජාතිකත්වය හෝ ජාතිකත්වයන්
- ඔබේ ස්ත්‍රී පුරුෂභාවය
- ඔබ භාවිත කර තිබෙන අනන්‍යතා හෝ සංචාරක ලේඛනවල පිටපත්, තිබේ නම්, ඒවායේ සත්‍යතාව පිළිබඳ ව තොරතුරු ඇතුළුව
- ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබාගත් නිලධාරියාගේ පරිශීලක හැඳුනුම සහ ඔබේ දත්ත ලබාගෙන සම්ප්‍රේෂණය කළ දිනයන්
- ඔබ අවසරයකින් තොරව රැඳී සිටි බව සොයා ගත් EU+ රට.

අවශ්‍ය විටෙක පහත තොරතුරු ද යුරෝඩැක්හි ගබඩා කරනු ඇත :

- ඔබ ස්වේච්ඡාවෙන් ඔබේ මව් රටට ආපසු යාමට ඉදිරිපත් වූ යෝජනාවක් පිළිගනු ලැබුවේ ද යන්න පිළිබඳ තොරතුරු
- ඔබේ ම තීරණයෙන් හෝ බලධාරීන් විසින් ඔබව ඉවත් කරනු ලැබුවහොත්, ඔබ ඔබේ මව් රටට ආපසු ගිය ඕනෑම වේලාවක තොරතුරු
- ඔබ නැවත පදිංචි කරවා ඇත්නම්, නැවත පදිංචි කරවන ලද EU+ රට.

යුරෝඩැක්හි ගබඩා කර ඇති සාවද්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ සංශෝධනය කිරීමත් එය නීති විරෝධී ලෙස හසුරුවා ඇත්නම් ඔබේ තොරතුරු මකා දැමීමට ඉල්ලා සිටීමත් ඔබට අයිතිය ඇත. මෙය සිදු කිරීම සඳහා ඔබට දත්ත පාලකය සම්බන්ධ කර ගත හැකිය. දත්ත පාලකයේ සම්බන්ධතා තොරතුරු **‘යුරෝඩැක් පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ’** යන විස්තර පත්‍රිකාවෙන් සොයාගත හැකිය.

## මගේ පුද්ගලික දත්ත යුරෝඩැක්හි කොපමණ කාලයක් ගබඩා කර තිබෙනු ඇති ද?



ඔබේ තොරතුරු වසර 5ක් ගබඩා කර තබාගෙන පසුව ස්වයංක්‍රීයව මකා දමනු ඇත.

මෙම කාල සීමාව ඉකුත්වීමට පෙර ඔබ EU+ රටක පුරවැසිභාවය ලබා ගන්නේ නම්, ඔබේ දත්ත මකා දැමෙනු ඇත. ඔබේ දත්ත මකා දැමුවහොත්, ඔබ පුරවැසිභාවය ලැබූ රටෙහි ඔබේ තත්ත්වයට මෙය බලපාන්නේ නැත.

## යුරෝඩැක්හි වෙනත් තොරතුරු ගබඩා කර තිබේ ද?

බලධාරීන් ඔබට පහත සඳහන් දේ කළ හැකි බව සොයා ගන්නේ නම්, ඔබේ ආරක්ෂක පරීක්ෂාවේ ප්‍රතිඵලය ගබඩා කර තබනු ඇත:

- ආයුධයක් ළඟ තබාගත හැකි නම්
- ප්‍රචණ්ඩකාරී විය හැකි නම්
- ත්‍රස්තවාදී අපරාධවලට සම්බන්ධ වී තිබේ නම්
- වෙනත් EU+ රටක ඔබව අත්අඩංගුවට ගත හැකි බරපතල අපරාධයක් කර තිබේ නම්.

එවැනි අවස්ථාවල දී, ඔබ අභ්‍යන්තර ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බවට සැලකේ. මෙය ඉහත විස්තර කර ඇති අදාළ හේතුව හෝ හේතූන් සමඟ යුරෝඩැක්හි ගබඩා කර තබනු ඇත.

EU+ රටවල් තවදුරටත් ඔබව අභ්‍යන්තර ආරක්ෂාවට තර්ජනයක් ලෙස නොසලකන්නේ නම්, මෙම තොරතුරු මකා දැමෙනු ඇත.

යුරෝඩැක්හි ගබඩා කර ඇති සාවද්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ සංශෝධනය කිරීමත් එය නීති විරෝධී ලෙස හසුරුවා ඇත්නම් ඔබේ තොරතුරු මකා දැමීමට ඉල්ලා සිටීමත් ඔබට අයිතිය ඇත. මෙය සිදු කිරීම සඳහා ඔබට දත්ත පාලකය සම්බන්ධ කර ගත හැකිය. දත්ත පාලකයේ සම්බන්ධතා තොරතුරු **'යුරෝඩැක් පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ'** යන විස්තර පත්‍රිකාවෙන් සොයාගත හැකිය.

මෙම සටහන දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම සටහනේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

. © European Union Agency for Asylum, 2025